**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 03 ක් සඳහා 2022 වර්ෂයේදී වෙන්කරන ලද එකතුව රු.275,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. | 2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය මැයෙන් අයවැය චක්‍රලේඛ අංක 03/2021 හා 2021 දෙසැම්බර් 21 දින නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛයට අනුව වියදම් පාලනය නිසා වැය විෂයන් 03 සඳහා ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. |
| (ආ) | සැලසුම් කරන ලද කාර්යයන් ඉටුකිරීමට වැය විෂයන් 12 ක් සඳහා 2022 වර්ෂයේදී වෙන්කරන ලද එකතුව රු.11,858,397 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වූ රු.8,231,089 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. එය එම වැය විෂයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 54 සිට සියයට 99 ක පරාසයක් වී තිබුණි. | ඉහත සඳහන් අයවැය චක්‍රලේඛයේ උපදෙස් පරිදි ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම දෙපාර්තමේන්තුව යටතේ පැවති ප්‍රාදේශීය සංවර්ධන අංශයේ කටයුතු අවසන් කිරීම නිසා නිලධාරීන් මුදාහැරීම හා ස්ථාන මාරු කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. |
| (ඇ) | අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කර නොගෙන වැය විෂයන් 04 ක් වෙනුවෙන් මු.රෙ 66 ප්‍රකාරව එකතුව රු.43,864,155,744 ක් ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි. | හදිසි අවශ්‍යතා සඳහා මෙම වැය විෂයන් තුළ ප්‍රතිපාදන අවශ්‍යතාව 2022 වර්ෂය තුළදී පැන නැගුන බැවින් අතිරේක ප්‍රතිපාදන මු.රෙ 66 මඟින් සලසා ගැනීමට සිදු විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබුණු වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.8,323,095,612 ක් සමාලෝචිත වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් හා මු.රෙ. 66 මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එම අමතර ප්‍රතිපාදන ලබා ගත් පසුව වැය විෂයයන් 05 ක එකතුව රු.272,785,724 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | වෙළඳපොළ භාණ්ඩ හිඟවීම නිසා අත්‍යාවශ්‍යව පැවති ටෝනර් සහ කාර්යාල ලිපි ද්‍රව්‍ය මිල ඇස්තමේන්තු කල මිලට වඩා අධිකව ඉහළ යාම, අධ්‍යක්ෂ තනතුරුවල ආවරණ කටයුතු වෙනුවෙන් ගෙවීම් කිරීමට සිදු වීම, ගෙවීම් කිරීමට අවශ්‍ය වවුචර්පත්‍ර නොලැබීම, ලෝක ආහාර වැඩසටහන මගින් ලබා දුන් ද්‍රව්‍යාධාර ගිණුම් ගත කිරීම හා එම ද්‍රව්‍ය ආධාර වරායෙන් නිදහස් කර බෙදාහැරීමේ කටයුතු සඳහා වූ වියදම් සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට සිදුවීම හා Promoting Autonomy, Literacy and Attentives Through Market Alliance Project in Sri Lanka ව්‍යාපෘතිය යටතේ මෙරට ද්‍රව්‍ය ආධාර ලෙස ලැබුණු ද්‍රව්‍යාධාරවල වටිනාකම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම සිදු කිරීම හේතුවෙන් වෙන්කරගත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. |

## 2.2 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.6 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන ඍජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙළ කල යුතු බව දක්වා තිබුණි. ඒ අනුව ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් අයකරගැනීම් රු.7,354,843 ක් ද, අත්තිකාරම් ගෙවීම් රු.6,002,111 ක් ද වී තිබුණි. නමුත් ඒවා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිළිවෙලින් රු.5,638,363 ක් හා රු.4,285,631 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව අත්තිකාරම් සඳහා මුදල් ගලාඒම් සහ ගලායාම් රු. 1,716,480 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා ප්‍රමිත අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදලින් පමණක් සිදු වන ගණුදෙනු පමණක් සඳහන් කළ යුතු බැවින් මුදලින් නොවන ගණුදෙනු ඇතුළත් නොකරන ලදි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, චක්‍රලේඛයේ 3 (අ) ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම සමඟ වාර්ෂික අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා ප්‍රසම්පාදන සැලසුම් මේ වන විට ඉදිරිපත් කර ඇත. මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විමසා මෙම කාර්යය ඉටු කරනු ලැබේ. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම. |

#### 3.1.2 කාර්යභාර ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සියලුම රජයේ දෙපාර්තමේන්තු සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර, ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවත්, ලෝක ආහාර වැඩසටහන (World Food Program) යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය 2023 ජනවාරි 01 සිට ජනාධිපති ලේකම් කාර්යාලය වෙත පවරා ගන්නා ලදි. ඒ අනුව සියලු ලිපිගොනු බඩු බාහිරාදිය ඇතුළු ව්‍යාපෘතිය බාරව ඇත්තේ ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ වන අතර විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ව්‍යාපෘති කාර්යාලය හා සම්බන්ධීකරණය කර අදාළ තොරතුරු මේ වන විට ලබා දී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ විදේශ ණය/ ආධාර යොදවා ක්‍රියාත්මක කරන විදේශ ව්‍යාපෘති 02 ක් වූ සමාජ ස්ථාවරත්වය පිහිටුවීම හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බලපෑමට ලක් වූ පවුල් වෙත සහන සැලසීම සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘතියන් හි වැය විෂයයන් 02 ක් සඳහා 2022 වර්ෂයේදී වෙන් කරන ලද එකතුව රු.634,104,060 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. | ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආර්ථික අර්බුදයේ බලපෑම් අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය යථා තත්වයට පත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සඳහා මුලිකව USD 400 ක් ලබා දීමට ලෝක බැංකුව එකඟ වුවද පසුව එය USD 325 දක්වා අඩුකරන ලදි. ඒ අනුව ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද සෞඛ්‍ය අංශයට අදාළ කාර්යයන් ක්‍රියාත්මක නොකිරීම හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බලපෑමට ලක්වූ පවුල් වෙත සහන සැලසීම ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ලද ආධාර සඳහා රුපියල් ගිණුම විවෘත කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරිවිය. | ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | සමාජ ස්ථාවරත්වය පිහිටුවීම ව්‍යාපෘතියේ වැය විෂයය අංක 237-1-1-19-1501-23/12 විදේශ ණය යටතේ මූල්‍යකරණ කර ඇති ශුද්ධ ප්‍රතිපාදනය රු.20,630,000,000 කින් රු.8,065,654,415 ක් පමණක් වැය කර රු.12,564,345,584 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 61 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. මෙම ඉතිරියට හේතුව ලෙස ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ යූරියා සඳහා ප්‍රසම්පාදනය ප්‍රමාද වීම බව දක්වා තිබුණි. | ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ යූරියා මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම නිසා මෙම ප්‍රතිපාදන භාවිතා කල නොහැකි විය. එමෙන්ම දෙසැම්බර් මස අගදී මෙ.ටො.16,787.20 හා මෙ.ටො.11,200 ක යූරියා පොහොර මෙරටට ගෙන්වීම සිදු වුවදලෝක බැංකු ආධාර ගෙවීම් සිදුකර වාර්තා කිරීම මගදී සිදු නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වීම. | ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනිම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් සමාජ ස්ථාවරත්වය පිහිටුවීම හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බලපෑමට පත්වූ පවුල් වෙත සහන සැලසීම සඳහා ක්‍රියාත්මක වූ විදේශ ණය යටතේ මූල්‍යකරණ කර ඇති ව්‍යාපෘති වෙනුවෙන් වෙන්කරන ලද එකතුව රු.98,919,000,000 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.71,654,995,940 ක් ප්‍රතිපාදන වෙන් කරන ලද වැය විෂයයන් සඳහා භාවිතයට නොගෙන | සමාජ ස්ථාවරත්වය පිහිටුවීම ව්‍යාපෘතිය පොහොර සහ ලිට්‍රෝ ගෑස් සඳහා ප්‍රතිලාභීන්ගෙන් මුදල් අයකර ගැනීමට පසුව තීරණය කරන ලදි. ඒ අනුව අවශ්‍ය ප්‍රතිපාදන 2302- ණය දීම වැය විෂය යටතේ රු.39,220,000 මාරු කිරීම සිදුවිය. මෙම ව්‍යාපෘතියේ සෞඛ්‍ය වැඩසටහන සඳහා ලබා දුන් ප්‍රතිපාදන වලින් රු.15,990,995,940.00 ක ප්‍රතිපාදන, ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බලපෑමට පත් වූ පවුල් වෙත සහන සැලසීම සඳහා වූ ව්‍යාපෘතිය සඳහා | ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි. එම ප්‍රමාණය, ව්‍යාපෘති වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 44 සිට සියයට 100ක පරාසයක පැවතුණි. | රු.10,554,777,900 ක මුදලක්ද, ලෝක ආහාර වැඩසටහන සඳහා රු.4,292,450,601.94 හා PALAMA ව්‍යාපෘතියට රු.1,143,767.94ක මුදලක්ද ප්‍රතිපාදන මාරු කර ඇත. එසේම මෙම ව්‍යාපෘතිය යටතේ වූ ඉතිරි ප්‍රතිපාදනය වන රු.මි 16,444,000,000ක මුදල එම ව්‍යාපෘති දෙක තුළම වූ කාර්යන් සඳහා සමෘද්ධි සහනාධාර වැඩිහිටි ආධාර හා වකුගඩු ආබාධිත ආධාර ලබාදීම සඳහා වූ වැය විෂයන් අතර මාරු කර ඇත. | |
| (ඇ) | ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බලපෑමට පත් වූ පවුල් වෙත සහන සැලසීම ව්‍යාපෘතියේ වැය විෂයයන් 04 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මු.රෙ. 66 මඟින් එකතුව රු.26,998,677,900 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එම අමතර ප්‍රතිපාදන සලසා ගැනීමෙන් පසුව එම වැය විෂයයන්හි ඉතිරියේ එකතුව රු.1,224,281,422 ක් වී තිබුණි. | ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බලපෑමට පත් වූ පවුල් වෙත සහන සැලසීම ව්‍යාපෘතියේ මෙම වැය විෂයන් 4 සඳහා අපේක්ෂිත වියදම ඇස්තමේන්තු කරන ලද්දේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ය. අදාල අංශ වලින් ලබාදෙන ලද මේ සඳහා පදනම් කර ගනිමිනි. එහෙත් මෙම ගෙවීම් කිරීමේදී සිදුවිය හැකි ද්විකරණයෙන් වලක්වන ලෙස රජය විසින් උපදෙස් ලබා දී තිබූ බැවින් තථ්‍ය වියදම මෙම අපේක්ෂිත වියදමට වඩා අඩුවෙන් වාර්තා කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |

## 3.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මස 16 වන දින දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකු වෙත ලබාදී තිබූ ලැප්ටොප් පරිගණකය විගණිත දිනය වූ 2023 මැයි 10 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත ආපසු භාරදීමට කටයුතු කර නොතිබුණු බව සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. | මේ වන තෙක් මෙම දෙපාර්තමේන්තුව වෙත මෙම ලැප්ටොප් පරිගණකය භාර දී නොමැති බැවින් 2022.12.13 දින ලිපියකින්ද ඒ මහතා වෙත දැනුම් දුන් අතර මේ දක්වා නිසි ප්‍රතිචාර දක්වා නොමැත. ඔබගේ 2023.05.12 දිනැති විගණන විමසුම ලැබීමෙන් පසුවද ඉහත සඳහන් ලැප්ටොප් පරිගණකය භාර දෙන ලෙස 2023.05.19 දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත දන්වා යවා ඇත. මෙම ලැප්ටොප් පරිගණකය විධිමත් පරිදි භාර දෙන තෙක් ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව මෙම කාර්යාලයේ රඳවා තබාගන්නා බවද දන්වමි. | මාරු වී යන අවස්ථාවේදී නිලධාරින් භාරයේ ඇති වත්කම් ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 4. තිරසර සංවර්ධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ 2030 වර්ෂය දක්වා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම හා ඒවාට ලඟාවීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්නායක හඳුනාගැනීම හා ඊට අදාල නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය නොවීය. | එක්සත් ජාතීන්ගේ 2030 වර්ෂය දක්වා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම හා ඒවාට ළඟා වීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්ණායක හඳුනා ගැනීම හා ඊට අදාල නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට කටයුතු කිරීම දැනටමත් තිරසර සංවර්ධන ජාතික සභාව මගින් අදාල ආයතන සමඟ ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය සහය දැනටමත් ලබා දී ඇත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම හා ඒවාට ළඟා විම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්ණායක හඳුනාගැනීම කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යමණ්ඩල දත්ත අනුව 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 26 ක් විය. ඒ අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් වර්ෂ කිහිපයක සිට පුරප්පාඩුව පැවතුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 හි උපදෙස් පරිදි පළමු පන්තියේ සියළුම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට මේ වන විට කටයුතු කරමින් පවතී. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පුරවා ගැනීම හෝ සේවක සංඛ්‍යාව යාවත්කාලින කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ආයතන සංග්‍රහයේ 13.3 වගන්තිය ප්‍රකාරව, තනතුරකට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළයුතු වුවද, දෙපාර්තමේන්තුවේ පුස්තකාලාධිපති තනතුර අවුරුදු 10 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | අවස්ථා ගණනාවක දී පුරප්පාඩුව පුරවන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇතත්, මෙතෙක් පුරප්පාඩුව පිරවීමට කටයුතු සිදු කර නොමැත. එහෙත් මේ වන විට අප විසින් හඳුනාගත් නිලධාරියෙකු පුස්තකාලයාධිපති වශයෙන් පත්කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |